**කොවිඩ්-19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා තුන්වන අතිරේක මූල්‍යනය -2021 සැප්තැම්බර් 27 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා**

---

කොවිඩ්- 19 හදිසි ප්‍රතිචාර සහ සෞඛ්‍ය පද්ධති සූදානම් කිරීමේ ව්‍යාපෘතිය සඳහා වූ තුන්වන අතිරේක මූල්‍යනයේ 2021 සැප්තැම්බර් 27 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වූ පළමු ගිණුම්කරණ කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව විසින් එළඹි 2021 සැප්තැම්බර් 24 දිනැති අංක පීඒඩී 4691 දරන ලෝක බැංකු වාර්තාවේ 40 වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම ප්‍රකාරව, සෞඛ්‍ය අමාත්‍යාංශය මෙම ව්‍යාපාතියේ විධායක නියෝජිතායතනය වන අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. කොවිඩ්-19 එන්නත් සඳහා දැරිය හැකි සහ සාධාරණ ප්‍රවේශයක් කඩිනමින් ස්ථාපනය කිරීම සහ එන්නත් පද්ධතිය ශක්තිමත් කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ ඵලදායී අන්දමින් එන්නත් යෙදවීම සහතික කිරීම සහ මව් ව්‍යාපෘතිය යටතේ සූදානම් කිරීමේ සහ ප්‍රතිචාර දැක්වීමේ ක්‍රියාකාරකම් තවදුරටත් ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණු විය. මෙම ණය ගිවිසුම ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 21,000 කට සමාන එ.ජ.ඩො. මිලියන 100 ක් මූල්‍යකරණය කිරීමට ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව එකඟ විය. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2021 සැප්තැම්බර් 27 වන දින ආරම්භ කරන ලද අතර 2023 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිතය.

## 1.3 මතය

------

2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති, රෙගුලාසි, කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2019 මාර්තු 05 දිනැති අංක 1/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 ඡේදය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස් විය යුතු වේ. කෙසේ වුවද, සමාලෝචිත කාලසීමාව තුළ එම කමිටුව රැස්වී නොතිබුණි. | පිළිගන්නා ලදී. ඉදිරියේදී අවම වශයෙන් මාස දෙකකට වරක්වත් ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව සංවිධානය කිරීමට කටයුතු කර ඇත. | චක්‍රලේඛ උපදෙස් පිළිපැදීමට කටයුතු කළ යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 පද්ධති සහ පාලන**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් සහ 2022 ජනවාරි මාසවල රු.මිලියන 16,102 ක පිරිවැයකට Pfizer එන්නත් මාත්‍රා මිලියන 14 ක් ලබා ගැනීමෙන් අනතුරුව, 2022 අගෝස්තු 22 දිනට මාස 06 කට වැඩි කාලයක් ගත වී තිබුණද, ඉන්වොයිසිවල මුල් පිටපත් විගණනය සඳහා ලබාදී නොතිබුණි. තවද, එන්නත් තොගයේ ලැබීම් සහ නිකුත් කිරීම් වෛද්‍ය සැපයුම් අංශයේ පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | • ඉන්වොයිසිවල මුල් පිටපත් විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.<br>• එන්නත් තොගයේ ලැබීම් සහ නිකුත් කිරීම් වෛද්‍ය සැපයුම් අංශයේ පරිගණක පද්ධතියට ඇතුළත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මුළු පිරිවැය රු. මිලියන 6,956 ක් වන එන්නත් මාත්‍රා මිලියන 6 ක් එන්නත් කිරීම සඳහා 2022 ජූලි 31 දින වන විට සෞඛ්‍ය ආයතන වෙත නිකුත් කර තිබුණි. මෙම එන්නත් දින 30 ක් ඇතුළත භාවිත කළ යුතුය. කෙසේ වුවද, ඉතිරි තොග ශේෂයට අදාළ තොරතුරු විගණනය සඳහා ලබාදී නොතිබුණි. සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයට අනුව, රු. මිලියන 31 ක් වටිනා එන්නත් මාත්‍රා 23,159 ක් දින 30 ඉක්මවීම හේතුවෙන් සෞඛ්‍ය ආයතන 147 ක් විසින් භාවිතයෙන් ඉවත් කර ඇති බව අනාවරණය විය. | අදහස් දක්වා නොමැත. | භාවිත කළ ප්‍රමාණය හෝ භාවිතයට නොගෙන ඉතිරිව ඇති ප්‍රමාණය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | එන්නත් කිරීම සඳහා සෞඛ්‍ය ආයතන වෙත නිකුත් නොකළ, රු. මිලියන 10,737 ක් (මිලදී ගත් මුළු තොගයෙන් සියයට 57 ක්) වටිනා එන්නත් මාත්‍රා මිලියන 8 ක් 2022 ජූලි 31 දින කල් ඉකුත්වීම හේතුවෙන්, ජාතික රුධිර පාරවිලයන මධ්‍යස්ථානයේ සහ වසංගත රෝග විද්‍යා ඒකකයේ ගබඩා කර තිබුණි. ඉන් අනතුරුව, 2022 මැයි 13 දින ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් හදිසි භාවිත ක්‍රියාවලිය සඳහා සෙල්සියස් අංශක ඍණ 60 ත් ඍණ 90 ත් අතර උෂ්ණත්වවල ගබඩා කර තිබුණු, විවෘත නොකළ එන්නත්වල ජීව කාලය මාස 09 සිට මාස 12 දක්වා වැඩි කිරීමට නිර්දේශ කර තිබුණි. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ | • Pfizer BioNTech සමාගම විසින් ලබාදී ඇති නිර්දේශවලට අනුව, එන්නත් සෙල්සියස් අංශක ඍණ 60 සිට ඍණ 90 දක්වා වූ Ultra-low උෂ්ණත්වය (ULT) යටතේ ගබඩා කළ යුතුය.<br>• එන්නත් සෙල්සියස් අංශක 2-8 උෂ්ණත්වයේ ගබඩා කර ඇත්නම්, Ultra-low උෂ්ණත්වය (ULT) වෙතින් ඉවත් කළ දින සිට දින 30 ක් දක්වා පමණක් එන්නත් භාවිතා කළ යුතුය.<br>• මෙම දින 30 තුළ භාවිතා | උපදෙස්වලට අනුව එන්නත් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | උපදෙස්වලට අනුව, එන්නත් මාත්‍රා මිලියන 7ක ජීව කාලය මාස 12 ක් දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වුවද, ජීව කාලය දීර්ඝ කළ එන්නත් මාත්‍රා 316,926 ක් 2022 සැප්තැම්බර් 05 දින වන විට එන්නත් කිරීම සඳහා නිකුත් කර තිබුණි. | නොකළ එන්නත්, නැවත භාවිතා කළ නොහැකි අතර, දින 30 කට පසු ඉවත දැමිය යුතුය.<br><br>• සෙල්සියස් අංශක 90 සිට 60 දක්වා උෂ්ණත්වවලදී ගබඩා කර තිබූ එන්නත්වල විවෘත නොකළ කුප්පිවල රාක්ක ජීව කාලය දීර්ඝ කිරීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ නිර්දේශ මත පදනම්ව සහ නිෂ්පාදකයාගෙන් ලැබුණු තොරතුරු සමාලෝචනය කිරීමෙන් පසුව, එන්නත් කාණ්ඩ හතරක ජීව කාලය 2022 ඔක්තෝබර් 31 දින දක්වා දීර්ඝ කිරීම සඳහා ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) මගින් නිර්දේශ කර ඇත.<br><br>• එන්නතෙහි එක් කාණ්ඩයක් සඳහා රාක්ක ජීව කාලය දීර්ඝ කිරීම සඳහා අනුමැතිය මේ වන තෙක් ලබාදී නොමැත. සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් කරන ලද විමසීමකදී, ජාතික ඖෂධ නියාමන අධිකාරිය (NMRA) විසින් දන්වා ඇත්තේ මෙම විශේෂිත කාණ්ඩයේ ජීව කාලය දීර්ඝ කිරීම සඳහා අවශ්‍ය තොරතුරු මේ වන තෙක් සැපයුම්කරුවන් විසින් ලබාදී නොමැති බවයි. | |
| (ඇ) | ව්‍යාපෘතියේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන්වී මාස දෙකක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවද, 2021 සැප්තැම්බර් 27 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලසීමාව සඳහා වූ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන 2022 ජුනි 17 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | පිළිගන්නා ලදී. | මූල්‍ය ප්‍රකාශන නියමිත කාලය තුළ විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |